ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/EHPS/05/2024/FA/08
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025 මැයි 29 දින.

ප්‍රාදේශීය සභාව
22899
05 JUN 2025
ඇහැලියගොඩ

ලේකම්,

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.වී.ජේ.එස්. පුෂ්පකුමාරි,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/EHPS/05/2024/FA/08 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 29 දින.

ලේකම්,

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත 11ක් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම හා ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායක වීමේ ගිණුම රු.5,148,063ක් අඩුවෙන් දැක්වුණි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද පිරිවැය රු.3,308,050ක් වූ වාහන 03කට අදාළව වෙන්දේසි ආදායම වූ රු.4,905,000ක් වත්කම් ගිණුමෙන් ඉවත් කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම සහ ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.1,596,950ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද පිරිවැය රු.675,000ක් වූ තලන යන්ත්‍රයේ පිරිවැය වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම (මෝටර් රථ හා කරත්ත ගිණුම) හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂ අවසානයට සාමාන්‍ය තොගය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් සහ වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,354,056ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්ත ණයගිමියන් රු.801,973ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් ප්‍රාග්ධන වියදම හා ජංගම වගකීම වැඩියෙන් දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 371(5) ප්‍රකාරව ලබාදුන් අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත්, 1995 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා 42කදී ලබා දී තිබුණු අත්තිකාරම් රු.1,902,321ක් 2025 අප්‍රේල් වන විටත් පියවා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,594,336ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,583,957ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,381,000 | 9,990,450 | 12,480,302 | 21,969,309 | 10,029,000 | 9,479,891 | 11,816,631 | 24,400,450 |
| කුලී | 10,935,100 | 13,062,416 | 13,581,250 | 766,807 | 11,652,500 | 12,285,671 | 12,088,896 | 1,313,907 |
| බලපත්‍ර ගාස්තු | 1,275,100 | 975,554 | 975,554 | 1,000 | 1,257,600 | 936,780 | 936,780 | 1,000 |
| වෙනත් ආදායම් | 10,364,500 | 13,582,427 | 19,491,899 | 1,211,930 | 9,926,100 | 11,043,888 | 9,332,714 | 3,258,189 |
| | 31,955,700 | 37,610,847 | 46,529,005 | 23,949,046 | 32,865,200 | 33,746,230 | 34,175,021 | 28,973,546 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.28,973,546ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.37,610,847ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.66,584,393ක් වුවද, රැස් කරන ලද ආදායම රු.46,529,005ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 30ක මට්ටමක පැවැතිණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු සහ බදු කුළී ආදායම යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 33කින් සහ 24කින් වැඩි වී තිබුණු අතර, බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 23කින්, 41කින් සහ 30කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.21,658,948ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.17,406,811ක් වූ වරිපනම් ඒකක 2,332ක් ඇතුළත් වී තිබුණි. ඉන් රු.446,586ක් පමණක් 2025 මැයි වන විට අයකරගෙන තිබුණු අතර, එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.195,701ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 05කට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 126කින් අයවිය යුතු රු.153,110ක් ඇතුළත් වී තිබුණි. ඉන් රු.139,554ක් 2025 මාර්තු මස අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ජල පාරිභෝගිකයින් 57ක ගෙන් ඉකුත් වර්ෂයට අදාළ හිඟ ජල ගාස්තු රු.65,760ක් 2025 මාර්තු වන විටත් අයකර ගෙන නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

සමාලෝචිත වර්ෂය තුළ ගාස්තු අය කළ යුතු තාවකාලික දැන්වීම් පුවරු හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. ඉකුත් වර්ෂවලදී හඳුනාගන්නා ලද ස්ථිර දැන්වීම් පුවරු 06ක් සඳහා අයවිය යුතු එකතුව රු.45,000ක මුදලක් 2025 අප්‍රේල් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.12,589,031ක් හා මුද්දර ගාස්තු රු.8,212,701ක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සදර්ලැන්ඩ් වත්ත හරහා ආදාගල දක්වා මාර්ගයේ මැනුම් කටයුතු කිරීම වෙනුවෙන් 2024 මාර්තු 01 දින මිනින්දෝරුවරයෙකු වෙත රු.155,000ක් ගෙවා තිබුණි. නමුත් මාර්ගය සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීමෙන් 2025 මාර්තු වන විටත් මාර්ගය ගැසට් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු, ව්‍යාපාර බදු සහ ව්‍යාපාර බලපත්‍ර අය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

ශයුම් සමාලෝචනය

සාධනය

ශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු වත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා ධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ ණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

සහ අපද්‍රව්‍ය කළමනාකරණය

බෙරුවාන කසළ අංගනය සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි. එමෙන්ම, නිපදවන කොම්පෝස්ට් පොහොර සඳහා තත්ත්ව සහතිකයක් ලබා ගැනීමට 2021 සැප්තැම්බර් 23 දිනැතිව ඉදිරිපත් කරන ලද පොහොර සාම්පලය තත්ත්වයෙන් අසමත් වී තිබීමෙන් තත්ත්ව සහතිකයක් ලබා ගැනීමට ද නොහැකි වී තිබුණි. කොම්පෝස්ට් පොහොර සඳහා වෙළඳපොලක් නිර්මාණය කිරීමේ අරමුණෙන් පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීමට උපදෙස් දී තිබුණ ද, 2025 අප්‍රේ වන විටත් ලියාපදිංචි වී නොතිබුණු අතර, පොහොර නිෂ්පාදන හා අලෙවි වාර්තා අනුව නිෂ්පාදනය කරන පොහොරවලින් සියයට 95ක ප්‍රමාණයක් අලෙවි කර ගත නොහැකි වී තිබුණි.

මනාකරණ අකාර්යක්ෂමතා

කරුණු නිරීක්ෂණය විය.

කොන්ත්‍රාත් පදනමින් මාර්ග කම්කරුවෙකු ලෙස සභාවේ සේවය කල අයෙකු 2006 ඔක්තෝබර් 20 දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ අර්ථසාධක අරමුදලට දායක නොකිරීම හේතුවෙන් ඔහු විසින් සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. නඩුවේ තීරණය අනුව අර්ථසාධක අරමුදල් දායකය හා ඊට අදාළ අධිභාර මුදල ලෙස රු.165,480ක් ගෙවීමට නියෝග කර තිබුණු අතර, එම මුදල සභා අරමුදලින් ගෙවීමට තීරණය කර ගෙවා තිබුණි. පසුව සභාවේ වගකීම හැර ඉතිරි මුදල වගකිව යුතු පාර්ශවයන් සිව් දෙනෙකුගෙන් අය කර ගැනීමට තීරණය කර තිබුණද, හිටපු සභාපතිවරයෙකුගෙන් අයකර ගතයුතු රු.49,644ක් 2024 දෙසැම්බර් වන විටත් අය කර ගෙන නොතිබුණි.

එකතුව රු.282,564,909ක් වූ වත්කම් විෂයයන් 13ක විස්තරාත්මක උප ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) තැන්පතු ගිණුම් 03ක පවතින එකතුව රු.8,128,152ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ ලිඛිත තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සභාව සතු කඩකාමරයක් වසර 03කට පෙර උසාවි නියෝගයක් මත කඩා ඉවත් කර ඇති බැවින් අඛණ්ඩව ගෙවා ඇති බදු මුදල් ආපසු ලබාදෙන ලෙස බදුකරු විසින් 2023 මාර්තු 16 දින ඉල්ලීම කර තිබුණි. උසාවි නියෝගයක් මත සභාව සතු කඩකාමරයක් කඩා ඉවත් කිරීම පිළිබඳව වසර 03ක් ගතවන තෙක් සභාව දැනුවත් නොවීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය.

(ඉ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් සිදු කරන ලද සූර්යය බල වීථි ලාම්පු සවිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන අමාත්‍යාංශය වෙත රු.390,000ක් ගෙවා සූර්යය බල වීථි ලාම්පු 20ක් ලබා ගෙන ඒවා නැවත භාර දී තිබුණ ද, ගෙවන ලද මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නැවත ලබා ගෙන නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

**වාහන උපයෝජනය**

සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා 2023 ඔක්තෝබර් මාසයේදී යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත භාර දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බැකෝ යන්ත්‍ර හා එක්ස්කැවේටර් යන්ත්‍ර කුලියට ගැනීම සඳහා රු.1,808,584ක් වැය කිරීමට සිදුව තිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

ප්‍රධාන අමාත්‍යාංශ අරමුදල් මූලාශ්‍රයෙන් රු.1,904,884ක මුදලක් ගෙවා පලීගල අඹතැන්න පාරේ ලීවල අසල සිට මඩුවන්දෙණිය හන්දිය දක්වා මාර්ගයේ මීටර් 500ක පමණ ප්‍රමාණයක් තාර යොදා සංවර්ධනය කර 2024 සැප්තැම්බර් 28 දින වැඩ නිමකර තිබුණි. මෙම මාර්ගයට තාර යෙදීම සඳහා රු.916,305ක් වැය කර තිබුණද, 2025 පෙබරවාරි 25 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී තාර යොදා ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගයේ බොහෝ ස්ථාන කැඩී ගොස් මතුපිට තාර සේදී ABC ගල් ඉතා පැහැදිලිව නිරාවරණය වී පැවැතිණි. එමෙන්ම මෙම කර්මාන්තයේ පැති කාණුව කැපීම සඳහා නිවැරදි පළාත් මාර්ග රේට යොදා නොගැනීම හේතුවෙන් රු.58,871ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, කාණුව නියමිත පරිමාවකට සකසා නොතිබුණි.

## 4. ශිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06කට අදාළව එකතුව රු.2,095,400ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 08කට අදාළව එකතුව රු.11,814,500ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 60 සිට සියයට 91 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03කට අදාළව එකතුව රු.6,500,000ක් වූ මුළු ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු.12,101,667ක් වැය දරා තිබුණ ද, ඒ සඳහා ප්‍රතිපාදන මාරුකර ගැනීමට හෝ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙසේ අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමේ ප්‍රතිශතය සියයට 112 සිට සියයට 1043 දක්වා පරාසයක පැවතිණි.

### 4.2 නොවිසඳී ඇති විගණන ඡේද

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ රු.39,281,227ක් වැයකර 2012 වර්ෂයේ වැඩ අවසන් කර තිබුණු ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ල 2018 වර්ෂය දක්වා වර්ෂ 06ක් නිෂ්කාර්යයව පැවති අතර, 2018 දෙසැම්බර් 31 දින රු.100,000ක මාසික කුළියකට වර්ෂයක කාලයක් සඳහා ගොඩනැගිල්ල බදු දී තිබුණි. කෙසේ වුවද බදුකරු විසින් ගොඩනැගිල්ලෙහි විවිධ අඩුපාඩු දක්වා කුළී මුදල් ගෙවීම පැහැර හැර තිබුණු අතර, සභා අරමුදලින් රු.2,331,013ක් වැය කර සියළු අලුත්වැඩියා කටයුතු නිම කර දී තිබියදී අරමුණුගත කාර්යය සඳහා ගොඩනැගිල්ල යෙදවීමට හා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු කුළී ගෙවීමට කටයුතු කර නොතිබුණි. බදුකරු වැඩ ආරම්භ කළ දින සිට බදු මුදල් අයකර ගැනීමට මහා සභාවේ හදිසි යෝජනා යටතේ අනුමත කර තිබීම හේතුවෙන් 2019 ජනවාරි මස සිට බදුකරු විසින් ගොඩනැගිල්ල ආපසු භාරදුන් 2020 ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 20 සඳහා බදු කුලිය හා පොළිය ලෙස එකතුව රු. 4,120,000 කට ආසන්න මුදලක් අයකර ගත නොහැකිව තිබුණි. වැඩ අවසන් කල දින සිට වර්ෂ 12ක් පුරා මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පවතින අතර, ඉදිකිරීම කටයුතු සඳහා ලබා ගත් ණය මුදල හා පොළිය පියවීම සඳහා මාසිකව රු.138,521ක මුදලක් 2036 ජනවාරි දක්වා ගෙවිය යුතුව තිබුණි.

ඩබ්.වී.ඒ.එස්. පුෂ්පකුමාරි,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.



ඩබ්ලිව්.වී.ඒ.එස්. පුෂ්පකුමාරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය